# ගොවි බලය ගොඩනගමු!

## ගොවි ජන අයිතීන් දිනා ගැනීමට එක්සත් වෙමු !

### ගැමි ගොවි ජනතාවගේ මැයි දින ප්‍රතිඥාව - 2024

**සාම්ප්‍රදායික කම්කරුවන් ලෙස අප හඳුන්වන්නේ වැඩපොළවල ශ්‍රමය වගුරවන්නන් වන අතර වර්තමානයේ අප ජීවත් වන දේශපාලනික වටපිටාව තුළ ගැමි ගොවීන්, ගෙවිලියන්, ධීවරයින්, සත්ත්ව පාලනයේ නියැලෙන්නන්, ආදිවාසීන් ප්‍රමුඛ ආහාර නිෂ්පාදකයන්, කෘෂිකාමරීක කම්කරුවන් පවා කම්කරුවන් ලෙස නොසැලකේ. නමුත් නූතන කම්කරු පන්තිය ශ්‍රමය වගුරවන ගොවීන් ඇතුළු ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සියල්ලෝ කම්කරුවන් ලෙස ප්‍රමුඛතාගත කිරීම අතිශය වැදගත් දේශපාලන කටයුත්තකි. සූරාකෑමකට හා දැඩි පීඩනයකට ඇද දමමින් ක්‍රියාත්මක වත්මන් දේශපාලන - ආර්ථික වැඩපිලිවෙළට පළමුවෙන් ම ගොදුරුවන්නේ සමාජය ප්‍රතිඋත්පාදනයට දායක වෙමින් සිටින ගොවීන් ගෙවිලියන් සහ සුලු පරිමාන ආහාර නිෂ්පාදකයන් ය. ලොව පුරා වැඩකරන ජනතාව තම 138 වන ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීමට මැයි 01 වෙනිදා සූදානම් වන මොහොතේ තම ශ්‍රමයේ වටිනාකම තහවුරු කිරීමටත්, සූරා කෑමට එරෙහිවත්, නිෂ්පාදන ක්‍රියාවලියේ අහිමි කිරීම් වලට එරෙහිවත්, ආහාර නිෂ්පාදන පිළිබඳ ඔවුන්ගේ ස්වාධිපත්‍ය ආරක්ෂා කිරීම වෙනුවෙන් ගොවි පන්තිය මෙවර මැයි දිනය ගොවීන්, ගෙවිලියන්, ධීවරයන්, සත්ත්ව පාලනයේ යෙදෙන්නන්, ආදිවාසීන්, තරුණ තරුණියන්, කෘෂිකාමරීක කම්කරුවන්, ඇතුළු සියලු සුලු පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ නායකත්වයන් සමග එක්ව සමරමු !**

**මේ එක්වීම හුදෙක් ම හුදකලා සටනක් නොවේ. ලොව පුරා ගොවින් ඇතුළු සියලු ආකාරයේ ආහාර නිෂ්පාදකයන් ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් අරඹා තිබේ. ඉන්දියානු ගොවින් ඔවුන්ගේ නිෂ්පාදනයේ අයිතිය උදුරා ගැනීමට සකස් කළ පනත් වෙනස් කිරීමට පෙළ ගැසී අඛණ්ඩව විදිබැස විරෝධය පලකරමින් සිටියි. ප්‍රංශය, පෘතුගාලය, බෙල්ජියම, රුමේනියාව, ජමර්නිය ඇතුළු යුරෝපය පුරා රටවල් 15ක් වෙළෙඳ ගිවිසුම් හරහා ගොවින්ගේ නිෂ්පාදන වලට ඇති මිල අහිමි කිරීමට හා දේශගුණික විපයර්‍ාස වලට පිළිතුරු සොයන මුවාවෙන් හරිත ආර්ථික වැඩපිළිවෙල නමින් හඳුන්වාදුන් ආයෝජකයන්ට හා බහුජාතික සමාගම්වලට වාසි ගෙනෙන සැලසුම් වලට එරෙහිව පෙළ ගැසෙමින් සිටී.**

**ගොවීන්, ගෙවිලියන්, ධීවරයන්, සත්ත්ව පාලනයේ යෙදෙන්නන්, ආදිවාසීන්, තරුණ තරුණියන්, කෘෂිකාමරීක කම්කරුවන්, ඇතුළු සියලු සුලු පරිමාණ ආහාර නිෂ්පාදකයන් මෙන් ම** විවිධ ආකාරයෙන් තමන්ගේ ගොවිබිම්වල කෘෂිකාමරීක හා අගය එකතු කරන්නන් ලෙස වඩා තීරණාත්මක සමාජ හා දේශපාලන ප්‍රතිසංස්කරණයක් වෙනුවෙන් පහත සඳහන් යෝජනා 2024 ගැමි ගොවි මැයි දිනයේ දී එයට සම්බන්ධව සිටින සියලු දෙනාගේ එකඟතාවන් මත සම්මත කර ගැනීමට ඉදිරිපත් කරමු.

මෙම යෝජනා හුදු ඉල්ලීම් පමණක් නොවන අතර, එම යෝජනාවන් මගින් බලාපොරොත්තුවන සැබෑ ගොවි ජන ප්‍රතිසංස්කරණයන් දිනා ගැනීම සඳහා අඛණ්ඩව ලංකාව පුරා විසිරී සිටින සියලු ප්‍රගතිශීලීන් සමග සම්බන්ධ වෙමින් නොනවතින මැදිහත්වීමක් සිදු කිරීම, අප විසින් ම පවරා ගන්නා වගකීමක් බව සියලු දෙනාට දන්වා සිටිමු. ඒ වෙනුවෙන් සංවිධානයවීම,එක්සත්භාවය ශක්තිමත් කිරීම, සහයෝගීතාව පුලුල් කිරීම, විකල්පයන් ගොඩනැගීම, හා නව පන්නයේ සමාජ, ආර්ථික හා දේශපාලන වැඩපිළිවෙලක් දිනා ගැනීම වෙනුවෙන් ගැමි ගොවි ව්‍යාපාරය ගොඩනගන්නෙමු.

- වී, කිරි ඇතුළු කෘෂි නිෂ්පාදන සඳහා සහතික මිලක් ලබාදීමේ ක්‍රමෝපායේදය ප්‍රායෝගික යථාතර්යක් කර ගැනීම සඳහා වසර පුරා නිෂ්පාදන මිල දී ගැනීම, ගබඩාකිරීම හා බෙදාහැරීමට රාජ්‍ය යාන්ත්‍රණයක් වහාම ඇති කළ යුතුය .
- සුළු පරිමාණ ගොවීන්ගේ, ධීවරයින්ගේ හා අනෙකුත් ආහාර නිෂ්පාදකයින්ගේ ජීවන මාගර්යන්හී සුරක්ෂිතභාවය හා තිරසරභාවය ආරක්ෂා කිරීම හා ඒ සඳහා තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ගොඩනැගීම .
- හරිත තාක්ෂණික ආයෝජන (සූයර් පැනල, සුළං බලාගාර ) වලට මුවාවී සිදු කරන පාරිසරික සංහාරය, ගොවීන්ගේ සම්පත් උදුරා ගැනීම නවතා දමා සැබෑ විසඳුම් ගොඩනැගිය යුතුය.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කොන්දේසි මත බලහත්කාරයෙන් ගැමි ගොවි ජනතාව මත පටවා ඇති අසාධාරණ බදු මෙන් ම අප සතු පොදු සම්පත් අහිමි කිරීමට හා ගොවිතැනින් ඉවත් කිරීමට දරණ සියලු උත්සහායන් පරාජය කළ යුතුය.
- රටේ සියලූ ජනතාවට ප්‍රමාණවත්, පෝෂ්‍යදායි, ආරක්ෂාකාරී සහ සංස්කෘතීන්ට ගැලපෙන ආහාර සාධාරණ හා දැරිය හැකි මිලකට ලැබීමේ අයිතිය තහවුරු කිරීම.
- නිදහස් වෙළෙඳ ගිවිසුම් , විවිධ රාජ්‍යයන් සමග ඇති කර ගන්නා ද්වි හෝ බහු පාශර්වීය ගිවිසුම් මගින් ගොවීන්ට මෙන් ම රටේ ස්වෛරීභාවයට සිදුවන බලපෑම් පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම හා හානිකර ගිවිසුම් පරාජය කිරීමට කටයුතු කිරීම.
- ආනයනය කරන බීජ, කෘෂිරසායනික, යන්ත්‍රසූත්‍ර ඇතුළු බහුජාතික සමාගම් හි ලාභය මූලික කරගත් වතර්මාන ලංකාවේ කෘෂිකාමරීක නිෂ්පාදන ක්‍රියාවලිය හා එය පවත්වාගෙන යාමට සකස් කරන ලද නීති වෙනස් කරමින් ගොවීන් හා පාරිභෝගිකයන් මූලික කරගත් ඒකාබද්ධ වැඩපිළිවෙලක් සකස් කිරීම.
- සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින්ට ඉඩම්, ජලය හා අනෙකුත් ස්වාභාවික සම්පත් සඳහා ඇති අයිතිය තහවුරු කිරීම හා ඒ පිළිබඳ තීන්දු තීරණ ගැනීමේ දී ඔවුන්ගේ ඍජු දායකත්වය ලබා ගත යුතු අතර තිරසර භාවිතය තහවුරු වන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවිය යුතුය. ඒවාට බාධා වන නීති හෝ අණපනත් ගෙන ඒමට දරණ උත්සාහයන් පරාජය කිරීම.
- සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට රජය විසින් ජාත්‍යන්තරව එකඟ වී ඇති ලෝක ආහාර හා කෘෂිකමර් සංවිධානයේ ස්වේච්ඡා මඟපෙන්වීම් හා අනෙකුත් ජාත්‍යන්තර ප්‍රඥප්තීන් හි සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අදාලව දේශීය නීති හා ප්‍රතිපත්තීන් සකස් කිරීම හා ඒවා ක්‍රියාවේ යෙදවීම සිදු කළ යුතුය.

- ගොවීන්ට තමන්ගේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, වැඩි දියුණුව, සංරක්ෂණය හා හුවමාරුව සඳහා ඇති අයිතිය තහවුරු කළ යුතුය.
- වතුකරයේ ජීවත් වන මලෙයගහ දමිල ජනතාවට ඉඩමක අයිතිය තහවුරු කිරීම මගින් ඔවුන් ආහාර නිෂ්පාදනය හා ජීවනෝපායමාගර් සඳහා යොමු කළ යුතුය.
- සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින් සමස්ත ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තුළ (නිෂ්පාදනය, සැකසුම, අගය එකතු කිරීම, බෙදා හැරීම හා අලෙවිය යන ආදිය) ශක්තිමත් කිරීම හා ඔවුන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනැගීම මගින් නිෂ්පාදකයින්ට හා පාරිභෝගිකයාට සාධාරණ මිලක් සැපයෙන යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.
- ජනතාවගේ ආහාර ස්වෛරීභාවය තහවුරු කිරීම පිණිස කාන්තාවන්ගේ කායර්ය හඳුනා ගැනීම, ඊට නිසි පිළිගැනීම ලබා දීම හා ඔවුන්ගේ ජීවිකාව සුරක්ෂිත කිරීම සඳහා මැදිහත් වීම සිදු කළ යුතුය.
- පසුගිය වසර 40 පුරා ක්‍රියාත්මක කළ සමාගම් මූලික කෘෂිකමර්ාන්තයේ විපාකවලට උත්තරයක් ලෙස හඳුන්වාදුන් ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රම අහෝසි කිරීම.
- ප්‍රජා මූල මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රජා මූල ණය හා ඉතුරුම් ක්‍රම මෙන් ම සමුපාකාර ක්‍රම ශක්තිමත් කරනවා වෙනුවට ඒවාට බාධා කිරීමට හඳුන්වාදෙන නීති හා පනත් වහාම හකුලා ගත යුතුය.
- දේශීය ආහාර අවශ්‍යතාව හා වෙළෙඳපොළ තත්ත්වය සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ ආහාර නිෂ්පාදන සැලසුම් සකස් කිරීම හා රජයේ කෘෂි හා ධීවර ව්‍යාප්ති සේවයන් යොදා ගනිමින් එම සැලසුම් ක්‍රියාවේ යෙදවීම.
- දේශීයව නිෂ්පාදනය කරන ආහාර ද්‍රව්‍ය සඳහා වසර පුරා ක්‍රියාත්මක නිශ්චිත ආනයන බද්දක් පනවා දේශීය ගොවියා ආරක්ෂා කිරීම.
- ආහාර නිෂ්පාදකයින්ගේ සමුපාකාර ගොඩනැගීම තුළින් සාමූහිකව වෙළෙඳපොළ අභියෝග ජයගැනීමට කටයුතු කිරීම මෙන් ම ආහාර නිෂ්පාදකයින්ගේ හා පාරිභෝගිකයින්ගේ සමුපාකාර හා වෙනත් කණ්ඩායම් අතර ඍජු සම්බන්ධතා ගොඩනැංවීම සිදු කළ යුතුය.
- පරිසර පද්ධතීන්ගේ තිරසර පැවැත්ම හා ඒවායේ ප්‍රතිඋත්පාදන ශක්තිය නැවත ගොඩනැංවීමේ හා දේශගුණික විපයර්ාස වළක්වා ගැනීමේ ක්‍රියාදායමක් බවට ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය පත් කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් බහුජාතික සමාගම් හා ව්‍යාපාර ඒකාබද්ධව ගොඩනගා ඇති කෘෂි ව්‍යාපාර (Agro Business) මුල් වූ කෘෂි ප්‍රතිපත්තීන්ගෙන් මිදුණු ආහාර නිෂ්පාදනය ප්‍රමුඛ වන, දේශීය සම්පත් පදනම් වූ පරිසර විද්‍යාත්මක ගොවිතැන මූලික වූ කෘෂිකමර් ප්‍රතිපත්තියක් ගොඩනැගීම.
- ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින කාන්තාවන්, තරුණ තරුණියන් ඇතුළු සුලු පරිමාණ ගොවීන් හා සමස්ත පාරිභෝගිකයින් සඳහා අහිතකර ලෙස බලපාන රජය විසින් ගනු ලබන තීරණ හා ජාත්‍යන්තර බලපෑම් පරාජය කිරීමට තරම් බලපෑම් කළ හැකි පුරවැසි බලයක් ගොඩනැගීමට දායක වීම.

ගොවි බලය ගොඩනගමු ! ගොවි ජන අයිතීන් දිනාගැනීමට එක්සත් වෙමු !

ජාත්‍යන්තර වැඩකරන ජනතාවගේ මැයි  දිනය ගොවි දිනයක් බවට පත්කර ගනිමු !

වලව ගොවි අයිතීන් සුරැකීමේ සංවිධානය

ගැමි ගොවි ව්‍යාපාරය

2024 මැයි 01 - ඇඹිලිපිටියේ දී

ගොවි බලය
ගොඩනගමු!
விவசாயிகளின்
பலத்தை
உயர்த்துவோம்!